ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 43 S I | චිත්‍ර කලාව I / Art I | කාලය : පැය තුනයි / Time : Three hours |
|---|---|---|---|

උපදෙස් :

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය. I කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුය.**
- II කොටස අනු කොටස් තුනකින් සමන්විතය. '(අ)' කොටසින් ප්‍රශ්න දෙකක් හා '(ආ)', '(ඉ)' කොටස් වලින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- I කොටස හා II කොටසට අයත් පිළිතුරු පත් එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.

## I කොටස

* ප්‍රශ්න අංක **01** සිට **05** තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතර ස්වභාවික ජලය පිරුණු තැන් සංකේතවත් කර ඇත්තේ,
   (1) තන්තිරිමලේ ගුහාවේය.
   (2) බිල්ලෑව ගුහාවේ ය.
   (3) දොරවක්කන්ද ගල්ලෙන තුළය.
   (4) වෙට්ටුම්බුගල ගල්ලෙන තුළය.
   (5) කුඩිම්බිගල ගල්ලෙන තුළය. (..........)

02. "පියන්ගල්" හා තපෝවන යනුවෙන් සෙල්ලිපිවල සඳහන්ව ඇත්තේ,
   (1) භාවනායෝගී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් තනන ලද ගෘහ නිර්මාණ විශේෂයකි.
   (2) ආරාමවාසී භික්ෂූන් වහන්සේලාට ස්නානය සඳහා තනන ලද ගෘහ නිර්මාණ විශේෂයකි.
   (3) භික්ෂූන් වහන්සේලා පොහොයකර්ම කිරීම සඳහා තනන ලද ගෘහ නිර්මාණ විශේෂයකි.
   (4) තපෝවන භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ඉදි කරන ලද ගෘහ නිර්මාණ අංගයකි.
   (5) ඖෂධ ගිල්වා උණුසුම් ජලවාෂ්ප උරා ගැනීමේ ක්‍රමයකි. (..........)

03. ස්ථූප පාදමේ අංජලී මුද්‍රාවෙන් මිනිස් රූප වළල්ලක් නිර්මාණ කර ඇත්තේ,
   (1) විජයොත්පාය හිය (2) ගඩලාදෙණි විහාරයෙහිය. (3) ලංකාතිලක විහාරයෙහිය.
   (4) නිශ්ශංකලතා මණ්ඩපයේ ය. (5) මැදිරිගිරිය වටදාගෙයිය. (..........)

04. තපස්සු භල්ලුක යන වෙළඳුන්ගේ විළඳ මී පිඩු පූජාව දැක්වෙන සිතුවම් දක්නට ඇත්තේ,
   (1) ගොනාගොල්ලෙනි.
   (2) හිඳගල විහාරයෙනි.
   (3) මහියංගන ධාතු ගර්භයෙනි.
   (4) තන්තිරිමලයෙනි.
   (5) සීගිරියෙනි. (..........)

05. හෙල්ල දරා සිටින්නා මූර්තිය
   (1) මයිරන් නැමති ශිල්පීය විසින් නිර්මාණය කරන ලද්දකි.
   (2) ප්‍රැක්යිටෙල්ස් ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.
   (3) පොලික්ලිටස් නැමති ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.
   (4) ග්‍රීක සම්භාව්‍ය අවධියේ දී කළ නිර්මාණයකි.
   (5) ග්‍රීක පෞරාණි අතේනේටන් යුගයේදී නිර්මාණය කර ඇත. (..........)

* ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුරු A, B, C,D, E, F රූප සටහන් ඇසුරින් තෝරන්න.


A


B


C


D


E


F

06. ලෝකඩ මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද මූර්තීන් වනුයේ,
(1) ACE (2) ABC (3) ADE (4) DEA (5) BCD (..........)

07. ඉවතලන ද්‍රව්‍ය (Found objects) උපයෝගී කර ගනිමින් කර ඇති නිර්මාණයක් වන්නේ,
(1) AC (2) BD (3) BC (4) DC (5) CF (..........)

08. ශ්‍රී ලාංකික නූතන වාදී මූර්ති කලාවේ ප්‍රයෝග සහ තාක්ෂණික භාවිතා කළ මූර්තියක් වනුයේ,
(1) A (2) B (3) C (4) D (5) E (..........)

09. 20 වන සියවසේ නූතනවාදී මූර්තිය වියුක්තවාදී ගමන් මඟ තීරණය කිරීමේ මග සැලසූ මූර්තියක් වනුයේ,
(1) A (2) E (3) C (4) B (5) F (..........)

10. මේවා අතරින් ශිෂ්‍යාචාරයකට අයත් මූර්තියක් වනුයේ,
(1) A (2) E (3) C (4) B (5) F (..........)


* ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර G, H, I, J, K ලෙස නම් කර ඇති පහත චිත්‍ර ඇසුරින් තෝරන්න.


G


H


I


J


K

11. G අක්ෂරයෙන් දැක්වෙන චිත්‍ර නම් කර ඇත්තේ,
(1) අල්බා මැඩෝනා නමින් හැඳින්වේ.
(2) මැඩෝනා ඔෆ් ද ඩියුක් නමින් හැඳින්වේ.
(3) සිස්ටයින් මැඩෝනා නමින් හැඳින්වේ.
(4) මැඩෝනා විත් ෆිෂ් නමින් හැඳින්වේ.
(5) ජේසු බිළින්දා මරියතුමිය නමින් හැඳින්වේ. (..........)

12. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම
   (1) වැලපෙන කත නමින් හැඳින්වෙන පැබ්ලෝ පිකාසෝගේ සිතුවමකි.
   (2) ගිටාරය සහිත මිනිසා නමින් හැඳින්වෙන ජෝර්ජ් බ්‍රාක්ගේ සිතුවමකි.
   (3) සැන්සියෝ නමින් හැඳින්වෙන පොල් ක්ලර්ග් සිතුවමකි.
   (4) නිල් කාමරය නමින් හැඳින්වෙන මෙට් කාසාට් ගේ සිතුවමකි.
   (5) විල් ආර්. නම් වූ පොල් ක්ලික්ගේ සිතුවමකි. (..........)

13. I අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කරන ලද්දේ,
   (1) රබින්ද්‍රනාත් තාගෝර්ය.
   (2) අබන්ද්‍රනාත් තාගෝර්ය.
   (3) නන්දලාල් බෝස්ය
   (4) ජෙමින් රෝයි ය.
   (5) අම්රිතා ශෙර්ගිල්ය (..........)

14. J අක්ෂරයෙන් දැක්වෙන තරු පිරි රැය නම් සිතුවම්
   (1) උපස්ථිතිවාදි ශිල්පියෙකුගේ නිර්මාණයකි.
   (2) පශ්චාත් උපස්ථිතිවාදි ශිල්පියෙකුගේ නිර්මාණයකි.
   (3) අමූර්තවාදි චිත්‍ර ශිල්පියෙකුගේ නිර්මාණයකි.
   (4) සතිකවාදි ශිල්පියෙකුගේ නිර්මාණයකි.
   (5) නූතනවාදී ශිල්පියෙකුගේ නිර්මාණයකි. (..........)

15. K අක්ෂරයෙන් දැක්වෙන රාගමාල සිතුවමත් දැක්වෙන්නේ,
   (1) ලාලිත්‍යා රාගයයි.
   (2) භෛරවි රාගයයි.
   (3) තෝඩිරාගයයි.
   (4) ආශාවරී රාගයයි.
   (5) කෙහෙදාර් රාගයයි. (..........)

* ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් යෝග්‍යා වරණය පහත සඳහන් L, M, N, O, P ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූ ඇසුරින් තෝරන්න.


L


M


N


O


P

16. L අක්ෂරයෙන් දැක්වෙන කැටයම සහිත නිර්මාණය,
   (1) ආගමික ඇදහිලි හා විශ්වාස පදනම් කරගත් පලඳනාවකි.
   (2) ග්‍රීසියේ පාතිනෝන් දේවස්ථානයෙන් හමු වූ කැටයමකි.
   (3) පැරණි රෝම මැටි බඳුන්වලට ආකෘතියකි.
   (4) නාමර් රජුගේ යුධ ජයග්‍රහණය දැක්වෙන ඵලකයකි.
   (5) රෝම වරුන්ගේ ජන ජීවිතය නිරූපිත ඵලකයකි. (..........)

17. M අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහන
(1) අනුරාධපුර බිසෝමාලිගය ඉදිරි පිටින් හමු වී ඇත.
(2) අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් හමු වී ඇත.
(3) පොළොන්නරුව වටදාගෙය ඉදිරි පිටින් හමු වී ඇත.
(4) මහනුවර දළඳා මාලිගය ඉදිරි පිටින් හමු වී ඇත.
(5) පොළොන්නරුව අටදාගෙය ඉදිරි පිටින් හමු වී ඇත. (..........)

18. N අක්ෂරයෙන් දැක්වෙන කැටයම් පුවරුව.
(1) බුදුන්වහන්සේ සංකස්ස පුරයට වැඩීම දැක්වෙන භාරුත් කැටයමකි.
(2) අනේපිඩු සිටු තුමා ජේතවනය පූජා කිරීම දැක්වෙන භාරුත් ගල් වැටෙහි කැටයමකි.
(3) බුදුන් වහන්සේ දැක්වීමට බෝධිය යොදාගත් සාංචි කැටයමකි.
(4) මහාකපි ජාතකය දැක්වෙන භාරුත් ගල් වැටෙහි කැටයමකි.
(5) රුරු මිග ජාතකය දැක්වෙන භාරුත් ගල් වැටෙහි කැටයමකි. (..........)

19. O අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
(1) ග්‍රීක කැටයම් ශිල්පියාගේ කුසලතාවය දැක්වෙන කැටයම් පුවරුවකි.
(2) රෝම වස්තු විද්‍යා නිර්මාණය අතර ආරුක්කු කැටයමකි.
(3) ට්‍රාජන් කුලුණු ආශ්‍රිතව දැක්වෙන රෝම වාස්තු විද්‍යා නිර්මාණයකි.
(4) රෝම වරුන් විසින් ග්‍රීක කැටයම් අනුකරණය කළ අවස්ථාවකි.
(5) රෝම පුරාවෘත්ත කැටයම් කිරීමට තනන ලද කුළුණු කැටයමකි. (..........)

20. P අක්ෂරයෙන් දැක්වෙන කැටයමින් නිරූපණය වනුයේ,
(1) ආකාශ ගංගාව පහළ වීමේ ප්‍රාතිහාර්ය දෙස විමතියෙන් බලා සිටින දෙවියන්, මිනිසුන් හා සත්වයින්ය.
(2) පූජනීය නම් වූ ගංගා නම් ගඟේ ඉහළට පිහිනායන නයින් දෙස බලා සිටින බැතිමතුන් පිරිසකි.
(3) ආකාශ ගංගාව නිසා ජලය උතුරා යාමෙන් සත්වයින් බේරා දෙන ලෙස බැතිමතුන් කරන ඉල්ලීමක්.
(4) කැටයමේ මැද ගංගා නම් ගඟ විවරය දෙස බලා සිටින බැතිමතුන්ය.
(5) විවරය තුළින් ජලය ගලා යන අයුරු බලා සිටින බැතිමතුන් පිරිසක්ය. (..........)

* ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

21. ඉන්දු නිම්නයෙන් හමු වූ පූජක රුව මූර්තිය
(1) භාවනානුයෝගී පූජකවරයෙකු ගේ මූර්තියකි.
(2) ග්‍රීක සම්භවයක් සහිත පූජකවරයෙකුගේ මූර්තියකි.
(3) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ පූජකවරයෙකුගේ මූර්තියකි.
(4) ඉන්දියානු ගෝත්‍රික නායකයෙකුගේ මූර්තියකි.
(5) මොංගෝලියානු මානව ලක්ෂණ ප්‍රකට කෙරෙන මූර්තියකි. (..........)

22. සෞන්දර්ය රීතියකින් මිනිස් සිරුර නිරූපය, සීමිත වර්ණමාලාක් යොදා ගැනීම සහ පර්යාවලෝක මූලධර්ම නිවැරදිව භාවිතා කිරීම යන කරුණු.
(1) උපස්ථිතිවාදයේ ලක්ෂණයකි.
(2) ශාස්ත්‍රාලීය යථාර්ථවාදයේ ලක්ෂණයකි.
(3) අධි යථාර්ථවාදයේ ලක්ෂණයකි.
(4) රොමැන්තික් වාදයේ ලක්ෂණයකි.
(5) යථාර්ථවාදයේ ලක්ෂණයකි. (..........)


23. මහනුවර යුගයේ පහතරට සිතුවම් කලාවේ විශේෂ ලක්ෂණයක් වනුයේ,
   (1) ජාතක කථාවලට වඩා චරිත කථා වලට වැඩි ඉඩක් ලබාදීම.
   (2) උප විඥානගත ආවේශයන්ගෙන් පැන නැගුණු තේමා සුලභ වීම.
   (3) ශ්‍රී ලංකාවේ ජනකලා සම්ප්‍රදායන්ගෙන් ආභාෂය ලැබූ චිත්‍ර ඇතුළත් වී තිබීම.
   (4) යුරෝපීය පාරිභාරික භාණ්ඩ හා ඇඳුම් පැළඳුම් චිත්‍ර තුළින් නිරූපණය වීම.
   (5) තීරු අතර පරතරය පුළුල් වීම හා අඛන්ඩ කථන ක්‍රමය නොසලකා හැරීම. (..........)

24. දෘෂ්‍ය කලාව යන්නෙන් නිර්වචනයට අදාළ නොවන කලා මාධ්‍ය වන්නේ,
   (1) ග්‍රැෆික් නිර්මාණ සැලසුම්කරණය.
   (2) බහු මාධ්‍ය කලාව
   (3) රෙදිපිළි හා ඇඟළුම් කලාව
   (4) සෙරමික් කලාව
   (5) ලේඛන කලාව (..........)


25. බෝධීන් වහන්සේලා වටා එහි ආරක්ෂාවට ඉදි කර ඇති පැරණි ගෘහ නිර්මාණ අංගයක් ලෙස දැක්වෙන්නේ,
   (1) ලාහුගල රජමහා විහාරය බෝධිය වට ඉදි වූ බෝධි සරයයි.
   (2) හම්බන්තොට සියන් ගල බෝධිඝරයයි.
   (3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි තිල්ලක්ගම බෝධිඝරයයි.
   (4) මැදවෙල ටැම්පිට විහාරයේ බෝධිය වට වූ ඉදි වූ බෝධිඝරයයි.
   (5) දඹුල්ල ලෙන් විහාර භූමියේ බෝධිය වටා ඉදි වූ බෝධිඝරයයි. (..........)

* ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා Q, R, S, T, U අක්ෂර වලින් අසා ඇති එක් එක් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.


Q


R


S


T


U

26. Q අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රය නිර්මාණය කරන ලද්දේ,
   (1) ඉන්දියානු චිත්‍ර ශිල්පිනී අම්රිතා ෂර්හිල් විසිනි.
   (2) අමූර්තවාදී ශිල්පි මාර්ක් චාර්නල් විසිනි.
   (3) ඉන්දියානු චිත්‍ර ශිල්පිනී ජෙමිනි රෝයි විසින.
   (4) ශ්‍රී ලංකා චිත්‍ර ශිල්පි L.T.P. මංජු ශ්‍රී විසිනි.
   (5) ඉන්දියානු චිත්‍ර ශිල්පි නන්දලාල් බෝස් විසිනි. (..........)

27. R අක්ෂරයෙන් දැක්වෙන වෝටර් ලිල යන ජපන් පාලම,
   (1) ජෝර්ජ්ස් බ්‍රාක්ගේ සිතුවමකි.
   (2) ඔගස්ට් රෙනෝගේ සිතුවමකි.
   (3) වින්සන්ට් වැන්ගෝගේ සිතුවමකි.
   (4) පොල් ගොනැන්ගේ සිතුවමකි.
   (5) ක්ලෝඩ් මොනේ ගේ සිතුවමකි. (..........)

28. S අක්ෂරයෙන් දැක්වෙන කැඩපත ළඟ ගැහැණිය නම් සිතුවම ඇඳ ඇත්තේ,

(1) අයිවන් පීරිස් විසිනි.
(2) රිචඩ් ගේබ්‍රියල් විසිනි.
(3) ජස්ටින් දැරණියගල විසිනි.
(4) ඩබ්ලිව් ජේ.ජී.බිලිං විසිනි.
(5) එල්.ටී.පී.මංජු ශ්‍රී විසිනි. (..........)

29. T අක්ෂරයෙන් දැක්වෙන කහ පැහැති ක්‍රිස්තුස් වහන්සේ නම් වූ සිතුවම

(1) පෝල් ගොගැන්ගේ නිර්මාණයකි.
(2) පෝල් සෙසාන්ගේ නිර්මාණයකි.
(3) වින්සන්ට් වැන්ගෝ ගේ නිර්මාණයකි.
(4) පැබ්ලෝ පිකාසෝ ගේ නිර්මාණයකි.
(5) මේරි කසාට් ගේ නිර්මාණයකි. (..........)

30. U අක්ෂරයෙන් නිරූපිත චිත්‍රය

(1) ඉන්දීය ජන ජීවිතය නිරූපිත අබිනින්ද්‍රනාත් තාගෝර් ගේ සිතුවමකි.
(2) ෆ්‍රීඩා කාලෝගේ කඳුකර යුවතියෝ නමින් හැඳින්වෙන සිතුවමකි.
(3) අම්රිතා ශෙර්ගිල් විසින් සිතුවම් කරන ලද මනාලියගේ දිය උල් හල නම් සිතුවමකි.
(4) ඉන්දීය ජන සමාජය නියෝජනය කර ජෙමිනි රෝයිගේ සිතුවමකි.
(5) ඉන්දීය නූතන යුගයේ චිත්‍ර ශිල්පියෙකුගේ නම් නොකළ චිත්‍රයකි. (..........)

* ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් පිළිතුරු සපයන්න.

31. මෙහි දැක්වෙන ගොඩනැගිල්ල



(1) මහනුවර යුගයට අයත් ටැම්පිට විහාරයකි.
(2) කතරගම දෙවියන් උදෙසා කරවූ දේවාලයකි.
(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති පනාවිට අම්බලමයි.
(4) මහාබලිපුරම් හි වෙරළේ ඉදි වූ දේවාලයකි.
(5) මහනුවර මඟුල් මඩුව (..........)

32. අගනා වාස්තු විද්‍යා අංග හා කැටයම් රාශියකින් යුත් මෙම මාලිගය



(1) I වන විජයබාහු රජතුමන් විසින් ඉදි කර ඇත.
(2) II වන බුවනෙකබාහු රජතුමා විසින් ඉදි කර ඇත.
(3) II වන පරාක්‍රමබාහු රජතුමන් විසින් ඉදි කර ඇත.
(4) I වන බුවනෙකබාහු රජතුමා විසින් ඉදි කර ඇත.
(5) IV විජයබාහු රජතුමන් විසින් ඉදි කර ඇත. (..........)

33. තමිල්නාඩු ප්‍රාන්තයේ තංජෝර්හි පිහිටා ඇති මෙම දේවාලය නම් කර ඇත්තේ,



(1) රජ රාජේශ්වර දේවාලය නමිනි.
(2) කුම්බ කෝනම් දේවාලය නමිනි.
(3) මහා මල්ල පුරම් හි වැලලේ දේවාල නමිනි.
(4) මහා බලි පුරම් හි මහිෂමාධිනී දේවාලය නමිනි.
(5) මහා බලිපුරම්හි රාත් දේවලය නමිනි. (..........)

34. මෝගල් වාස්තු විද්‍යාත්මක නිර්මාණය අතර සුවිශේෂී නිර්මාණයක් වූ මෙය,

(1) හුමායන් යුගයේ දී නිර්මාණය වූවකි.
(2) අක්බර් රජු සමයේ නිර්මාණය වූවකි.
(3) ජෙහන්ගිර් රජු සමයේ නිර්මාණය වූවකි.
(4) සාජහාන් යුගයේ දී නිර්මාණය වූවකි.
(5) අවුරංග සෙබ් යුගයේ දී නිර්මාණය වූවකි.



(..........)

35. මෙහි දැක්වෙනුයේ,

(1) ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පයේ භාවිත වූ කුළුණු විශේෂයකි.
(2) ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පය අනුකරණය කරමින් රෝමවරුන් විසින් ගොඩනැගුණු නිර්මාණයකි.
(3) ග්‍රීසියේ සම්භවය යුගයේ ඉදි වූ අයොනික් කුළුණු විශේෂයකි.
(4) ඔලිම්පියා සියුස් දේවස්ථානයේ ඉදි වූ කොරින්තියන් කුළුණු විශේෂයකි.
(5) මිසර ශිල්පීන් අනුගමනය කරමින් ඉදි වූ කුළුණු විශේෂයකි.



(..........)



36. ඉහත දැක්වෙන සිතුවම දැකිය හැක්කේ,

(1) දකුණු පළාතේ මුල්කිරිගල විහාරගෙය තුළිනි.
(2) තෙල්වත්ත විහාර බිතුසිතුවම් තුළිනි.
(3) වැව්රුකන්නළ විහාරගෙය තුළිනි.
(4) පැරණි කැලණි රජමහ විහාරගෙය තුළිනි.
(5) දෙගල්දොරුව රාජමහා විහාර බිතුසිතුවම් තුළිනි. (..........)

37. මෙම සිතුවම සඳහා මාතෘකාක වී ඇත්තේ,

(1) නුවර පෙරහැර හා සම්බන්ධ කතා පුවතකි.

(2) රාජකීය පෙරහැරක සංගීතකරුවන් පිරිසකි.

(3) සංගීතය හා විනෝදවීම පිළිබඳ සිද්ධි මාලාවකි.

(4) තේලපත්ත ජාතකයේ ශ්‍රවණේන්ද්‍රීය ආකර්ෂණය කිරීම පිළිබඳවය.

(5) රජවාසල සංගීතඥයෝ පිළිබඳ සිද්ධි මාලාවකි. (..........)

38. මෙම සිතුවම තුළින්,

(1) විසිතුරු ඇඳුම් මෙන්ම ජන ජීවිතයේ ප්‍රීතිමත් අවස්ථාවක් නිරූපණය කරයි.

(2) ජාතක කතාකරුවා නිර්මාණය කළ විවිධ කතා පුවත් අතර වැදගත් සිදුවීමක් සංකේතාත්මකව දැක්වීමක් සිදු කර ඇති බව පැහැදිලිය.

(3) මහනුවර යුගයේ වංශාධිපතිවරුන් තම දෛනික ජීවිතය ප්‍රීතිමත්ව තබා ගැනීමට ගත් උත්සාහයක් නිරූපිතය.

(4) උඩරට සම්ප්‍රදායේත් පහත රට සම්ප්‍රදායේත් මානව රූ ඇඳීම පිළිබඳ ශිල්පීය පරිණත බව පැහැදිලි කරයි.

(5) පෙරබිම හා පසුබිම දැක්වීමේදී පහතරට ශිල්පියා සතුව තිබූ හැකියා හොඳින් නිරූපණය කරයි. (..........)

39. මෙම සිතුවමෙහි,

(1) වර්ණනා ලක්ෂණ වඩාත් මතු කර දැක්වීමට ශිල්පියා උත්සා දරා ඇත.

(2) පසුබිම දැක්වීමේ දී මහනුවර යුගයේ වර්ණ පදාස ක්‍රමය අනුගමනය කර ඇත.

(3) මානව රූ වල දිගටි බව මෙන්ම එළිය අඳුර දැක්වීම මනාව දක්වා ඇත.

(4) පහතරට සිතුවම්වල දැකිය හැකි ද්විමාන බව, රිද්මයානුකූල රේඛාව, සීමිත වර්ණ පෙළ හොඳින් දැකිය හැකිය.

(5) අඛණ්ඩ කථන ක්‍රමය තුළින් ශිල්පීය දක්ෂතා මෙන්ම ක්‍රියාකාරී මානව රූ ද දැකිය හැකිය. (..........)

40. මෙම සිතුවමේ ශිල්පීය කුසලතා පිළිබඳ සැලකීමේ දී පැහැදිලි වන්නේ,

(1) වියලි බදාමය සහිත බිතුතලය පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගනිමින් මානව රූ මනා ලෙස සම්පිණ්ඩනය කිරීමට ශිල්පියා ගත් උත්සාහය සාර්ථක බවයි.

(2) ඇතැම් තැන්වල ද්විමාන ලක්ෂණත් ඇතැම් තැන්වල ත්‍රිමාණ ලක්ෂණත් තේමාවට ගැළපෙන ලෙස යොදා ගැනීමට ශිල්පියා දක්වා ඇති දක්ෂතාවයි.

(3) පසුබිමෙහි දැක්වෙන අවකාශය පිරවීමට නෙළුම් මල්, බිනර මල් ආදිය දක්ෂ ලෙස යොදාගෙන ඇති බවයි.

(4) පාර්ශවගත මානව රූ මෙන්ම ඍජු දර්ශී මානව රූ තුළින් ශිල්පියා සම්ප්‍රදාය බිඳ දමා ඇති බවයි.

(5) ක්‍රියාකාරි රූ සම්පිණ්ඩනය කිරීමට පහතරට ශිල්පියා දක්ෂතාවක් නොදක්වා ඇති බවයි. (..........)

## II කොටස

## (අ) කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ලංකාව)

(1) ලාංකීය මධ්‍යතන අවධියට අයත් වාස්තු විද්‍යාත්මක නිර්මාණ හා කැටයම් නිර්මාණ හෙළ කලාකරුවාගේ විශිෂ්ඨත්වය විදහා පායි.

(i) ගම්පල යුගයට අයත් හින්දු ගෘහ නිර්මාණ ලක්ෂණ දැකිය හැකි බෞද්ධ විහාර දෙකක් නම් කරන්න.

(ii) යාපහුවේ කැටයම් පිළිබඳව කලාත්මක විග්‍රහයක් එහි පියගැට පෙළ හා ද්වාර මණ්ඩපය ආශ්‍රිතව දැකිය හැකි නිර්මාණ ඇසුරෙන් සිදු කරන්න.

(iii) ගම්පොළ යුගයේ දැව කැටයම් දැකිය හැකි ඇම්බැක්කේ දේවාලය හා පනාපිටියි අම්බලම පිළිබඳව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න.

(2) ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික වාස්තු විද්‍යා අංග පිළිබඳ විමසීමේ දී ස්තූපය ආශ්‍රිත නිර්මාණ අංග හා සර සංකල්පය ආශ්‍රිත අංගයන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි.

(i) සර සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) සඳකඩ පහණ හා මුරගලේ කලාත්මක විකාශනය උදාහරණ ආශ්‍රයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න

(iii) පොළොන්නරුව තිවංක පිළිමගෙයි ගෘහ නිර්මාණ අංග හා ලංකාතිලක පිළිම ගෙයි නිර්මාණ අංගයන් පිළිබඳව ඇගයීමක යෙදෙන්න.

(3) ශ්‍රී ලාංකේය දෘෂ්‍ය කලාව කෙරෙහි අපරදිග හා පෙරදිග සම්ප්‍රදායන් වලින් ඇති කරන ලද බලපෑම 20 වන සියවසේ ශිල්පීන්ගේ නිර්මාණ තුළින් පැහැදිලිව ගම්‍යමාන වේ.

(i) ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ 2 ක් නම් කරන්න.

(ii) A.C.G.S.අමරසේකර ශිල්පියාගේ නිර්මාණ කෙරෙහි යුරෝපා ලක්ෂණ බලපා ඇති ආකාරය විමසීමට ලක් කරන්න.

(iii) එම්.සාර්ලිස් ශිල්පියාගේ ලිතෝ මුද්‍රිත සිතුවම් හා හේලිස් මැන්දිස් ශිල්පියාගේ නව කැළණි විහාර සිතුවම් වල වාස්තු විෂය වර්ණ භාවිතය, රේඛා භාවිතය හා කලා සිද්ධාන්ත භාවිතා කර ඇති ආකාරය සංසන්දනාත්මකව විමසීමට ලක් කරන්න. (උදාහරණ සහිතව)

## (ආ) කොටස
## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - (ඉන්දියාව)

(4) ලොව ඉපැරණිතය ශිෂ්‍යාචාරයක් වන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මොහෙන්දෝ ජොදාරො සහ හරප්පා හනර පාලන මධ්‍යස්ථානය කර ගනිමින් පුර රාජ්‍ය ක්‍රමය පාලනය වී ඇත.

(i) ඉන්දු නිම්නයෙන් හමුවුනු මුද්‍රා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉන්දු නිම්න මූර්ති අතර හමුවන 'නලගන රුව' කලා කෘතියකි. මධ්‍ය, ශිල්ප ක්‍රම, තාක්ෂණ කලාත්මක ලක්ෂණ සහ ආගමික සංකල්ප පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) ඉන්දු නිම්න වැසියන් ඉතා දියුණු ක්‍රමවත් නගර සැලසුමක් අනුව කටයුතු කළ බව ඔවුන්ගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරින් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(5) මෝගල් චිත්‍ර කලාවේ පෙරළියක් ඇති කරමින් නවතම චිත්‍ර සම්ප්‍රදායක් 'රාජපුර' නමින් රාජ්පුටානා ප්‍රදේශයේ හින්දු ශිල්පායතන ආශ්‍රිතව බිහි විය.

(i) රාජපුර ශිල්පියාට තේමා සැපයූ සාහිත්‍යය කෘති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) 'අක්බර නාම' නම් සිතුවම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 05)

(iii) 'ආකෘතිය අතින් මෝගල් චිත්‍ර සම්ප්‍රදාය අනුව ගිය ද සංකල්පය වශයෙන් ස්වදේශීය හින්දු සංස්කෘතිය අනුව රාජපුර චිත්‍ර කලාව වර්ධනය වූ බව පෙනේ' විමසන්න. (ලකුණු 08)

## (ඉ) කොටස
## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - (යුරෝපය)

(6) නයිල් ගංගාධාරය පදනම් කරගෙන බිහි වූ මිසර ශිෂ්‍යාචාරය කලා නිර්මාණ රැසක් ලොවට බිහි කළ ශිෂ්‍යාචාරයකි.

(i) මිසර ශිෂ්ටාචාරයෙන් හමුවුන සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) නිශ්චිත පුද්ගලයෙක්, නිශ්චිත සිදුවීමක්, නිශ්චිත කාලවකවානුවක් නිවැරදිව හඳුනාගත හැකි පළමු වැනි ඓතිහාසික දෘෂ්‍ය කලා කෘතිය ලෙස 'නාමර පලකය' හඳුනා ගත හැකිය. සැකෙවින් පහදන්න. (ලකුණු 05)

(iii) පිරමිඩයක සැලසුම්කරණය උපයෝගිතාවය අමුද්‍රව්‍ය භාවිතය, තාක්ෂණික භාවිතය විකාශනය පිළිබඳවය. පැහැදිලි කරන්න. (ලකුණු 08)

(7) පුනර්ජීවන යුගයේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාව නව ප්‍රවණතා කරා යොමු කිරීමට ගවේෂණයේ පසුකාලීන ශිල්පීන්ට හැකි විය.

(i) ලියනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) මයිකල් ආන්ජලෝගේ 'අවසන් විනිශ්චය' සිතුවම් තේමාව ආකෘතිය පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න. (ලකුණු 05)

(iii) 'මනුෂ්‍යාත්වයට එරෙහිව මිනිසා තුළින් මතුවන වෛරය ක්‍රෝධය වැනි අමානුෂික කෘෘරකම් තම චිත්‍ර භාෂාව තුළින් ප්‍රකාශ කිරීමට පිකාසෝ වෙහෙසින.' උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08)

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 43 | S | II | චිත්‍ර කලාව II<br>Art II | කාලය : පැය තුනයි<br>Time : Three hours |
|---|---|---|---|---|---|

**උපදෙස් :**

- ඔබේ විභාග අංකය / නම චිත්‍රය පසුපස පැහැදිලිව ලියන්න.
- චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබිය යුතුය. (දිය සයන් චිත්‍රයක් නම්)
- දියසායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ආදී ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

**ස්වභාවිකත්වය අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පින්ඩනය**

- පහත සඳහන් කරුණු සැළකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.

1. ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.
2. චිත්‍රය ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබිය යුතුය. (දිය සායම් චිත්‍රයක් නම්)
3. ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.
4. ඔබේ විභාග අංකය / නම චිත්‍රය පසුපස පැහැදිලිව සඳහන් කරන්න.
5. ඔබගේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ඇත.

   - කඩදාසි තලය අර්ථවත්ව භාවිත කිරීම.
   - ද්‍රව්‍යවල ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණ, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක ලක්ෂණ පෙන්වීම.
   - වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම.
   - ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකය (ලෑල්ල) ගැලපෙන පරිදි සකස් කර ගැනීමට අවසර ඇත.


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| | | | |
|---|---|---|---|
| 13 ශ්‍රේණිය | 43 S III | චිත්‍ර කලාව III<br>Art III | කාලය : පැය තුනයි<br>Time : Three hours |

- පහත සඳහන් '(අ)','(ආ)' සහ '(ඉ)' යන කොටස් තුන අතුරින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

**'(අ)' කොටස - චිත්‍ර සංරචනය**

(1) ගංවතුරට කොටු වූ ගැමි පවුලක් හෝ රාත්‍රී ආගමික උත්සවයක්.

(2) මුහුදු ධීවර ගම්මානයක් / ගමේ සතිපොළ හෝ නාගරික වෙළෙඳපොළක්

(3) ගම් වැදුණු අලි රංචුවක්

(4) වන සතුන් සැරිසරන වන උද්‍යානයක චාරිකාවේ යෙදෙන පිරිසක්

**'(ආ)' කොටස - මෝස්තර නිර්මාණය**

(1) කුඩා දරුවකුගේ භාවිතයට සුදුසු රෙද්දක් මුද්‍රණය සඳහා වියුක්ත සත්ව හැඩතල භාවිතයෙන් උචිත ව්‍යාප්ත මෝස්තරයක් 9 x 9 ප්‍රමාණයට නිර්මාණය කරන්න.

(2) සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර ඒකක ඇසුරෙන් වියන්තලයක් නිර්මාණය කරන්න.

හෝ

(3) විසිත්ත කාමරයකට සුදුසු 8 x 6 ප්‍රමාණයේ බිතු කැටයමක් නිර්මාණය කරන්න.

**'(ඉ)' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය**

(1) කාන්තා සපත්තු නිර්මාණය කරන ආයතනයක ප්‍රචාරක පුවරුවක් සඳහා විචිත්‍රවත් නිර්මාණයක් කරන්න.

(2) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන තේ පැකට්ටුවකට උචිත සැලැස්මක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය හා හැඩය අභිමත පරිදි තීරණය කරන්න).

(3) 'දුම් වැටිය ජීවිතය දවාලයි' මැයින් විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

හෝ

'සෙනෙහසක මතක' නැමති යොවුන් ආදර නවකතාවකට සුදුසු පොත් පිට කවරයක් නිර්මාණය කරන්න.

PAST PAPERS WIKI

(12) WWW.PastPapers.WiKi (12)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!